# පසිඳුටයි සඳුනිටයි හොඳ පාඩමක්



එෂිනි අංජානා ගුණවර්ධන

# පසිඳුටයි සඳුනිටයි හොඳ පාඩමක්

කතාව හා චිත්‍ර

**එෂිනි අංජානා ගුණවර්ධන**

1 වන මුද්‍රණය 2023

ISBN – 978-624-206-584-7

# පිදුම

පහ ශ්‍රේණියේ මා හට මග පෙන්වූ K.P.S.D
තිලකරත්න ගුරු පියාණන්ට

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක් ” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

**2023** සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01



"පසිඳු , සඳුනි ඔය දෙන්නා පුදුම විදියට වතුර නාස්ති කරනවා.

බලන්න මේ නානකාමරේ වතුර කරාම දෙකම ඇරලා දාලා ගිහිල්ලා."

අම්මා තරහින් කීවා.

හරි හරි අපි ආයෙ කරන්නේ නෑ.

"හොඳයි මං අදට සමාව දෙනවා" කියලා අම්මා කියන්නත් කලින්ම

මේ දෙන්නා ආයෙත් වතුර එක්ක සෙල්ලම් කරන්න පටන් ගත්තා.



"මට මේක කරන්න බෑ. එන්න එන්නම වතුර බිලත් වැඩි වෙනවා. සඳුනි , පසිඳු මෙහාට එන්න බලන්න අපේ වතුර බිල කොයිතරම් වැඩි වෙලාද කියලා. ඔයාල දැනගන්න ඕනේ වතුර අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්න."

පසිඳුයි සඳුනියි ඒක ඇහුනෙ නෑ වගේ එතනින් යන්න ගියා.



දුව දැන් නම් හොඳටම හවස් වෙලා. දැන් සෙල්ලම් කලා ඇති.

දෙන්නම ඇඟ හෝදගන්න.

හරි අම්මේ......

සඳුනි නාන කාමරයට ගියා ඇඟ හෝදගන්න. ජල කරාමය ඇරියට වතුර ආවෙ නෑ.

ම්......හරි පුදුමයි

"අම්මේ මෙහාට එන්නකෝ" සඳුනි අම්මට කතා කළා.

"හරි හරි මං මේ එනවා" අම්මා කිව්වා.

"අම්මේ  නානකාමරේ වතුර එන්නෙ නෑනෙ."

"ආ එහෙමද කෝ බලන්න. ඇත්ත තමයි."

අම්මා කුස්සියේ කරාමයත් බැලුවා. කුස්සියෙත් වතුර එන්නෙ නෑ .

"ආනේ වතුර එවන එක නවත්තලා ද කොහෙද? දැන් මොකද කරන්නේ?" අම්මා කිව්වා.

මේ පායන කාලයේ මේ වතුර ටික එවන්නෙත් බොහොම අමාරුවෙන්. අපි දැනගන්න ඕනෙ ඒ වතුර ටික අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්න.

බලන්නකෝ දැන් ඔයාලට ඇඟ හෝදන්නත් නෑ. රෑට උයන්න වෙන්නෙත් නෑ. මං බාල්දියකට එකතු කරපු වතුර ටිකක් තියෙනවා. ඒකෙන් මූණ විතරක් වත් හෝදගන්න. වෙන මොනව කරන්නද?

පසිඳු,චූටි පුතා මෙහාට එන්නකෝ.

ඇයි අම්මේ?

බලන්නකෝ ඔයාලා කිසි පරිස්සමක් නැතුව වතුර නාස්ති කරපු නිසා අපට දැන් වතුර එන්නේ නෑ. නාගන්න, රෙදි සෝදන්න, රෑට උයන්න විදිහකුත් නෑ. කවදා ආයෙ වතුර එවයි ද දන්නෙත් නෑ.



මොනවා?

ඒකනෙ මං හැමවෙලේම ඔයාලට කිව්වේ වතුර නාස්ති කරන්න

එපා කියලා.

අපට සමාවෙන්න අම්මේ!

දැන් ඉතින් මොනවා කරන්නද? දැන් පරක්කු වැඩියි.

"ඇයි අම්මේ, රෑට උයන්නත් වතුර ඕනද ?" මල්ලි ඇහුවා.

ඔව් මොකද නැත්තේ. අපට එදිනෙදා වැඩ වලදී ජලය අත්‍යාවශ්‍යයි. බීමට, නෑමට, රෙදි සේදීමට ,ආහාර පිසීමට ගස්වැල්වල වර්ධනයට වගේ ගොඩක් දේවල්වලට ජලය අත්‍යවශ්‍යයි. මිනිසාට ජලය නැතුව ජීවත් වෙන්න බෑ.



දැන් ඔයාලට තේරෙනවා නේද? ජලය කොච්චර අපට වටිනවද කියලා.

දින දෙකක් පුරාවටම මේ ප්‍රදේශයට වතුර සැපයීම තිබුණේ නෑ. මෙයාලා හරිම අමාරුවෙන් තමයි මේ දවස් දෙකේ එදිනෙදා වැඩ කරගත්තේ.

ඊළඟ දවසේ උදේ වතුර ආවා. පසිඳුටයි, සඳුනිටයි හරිම සතුටුයි. එදායින් පස්සෙ කවදාවත් එයාල නිකරුනේ වතුර නාස්ති කළේ නෑ.

**ආදර්ශය** – ජලය යනු අපට ඉතා වටිනා සම්පතක් වන බැවින් අපි එය සැමදා සුරැකීමට වගබලා ගත යුතුයි .

**කතාව ඇසුරින් ප්‍රශ්න ස්වල්පයක්.**

බලන්න ඔබටත් මේවට පිළිතුරු සැපයීමට හැකි ද කියා.


1. කතාවේ සිටින චරිත නම් කරන්න

2. ජලයෙන් ඇති ප්‍රයෝජන හතරක් නම් කරන්න

3. මේ කතාවෙන් ඔබට ලැබෙන ආදර්ශය කුමක්ද?








welcome





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01